බාලවයස්කාර ලිංගික අපයෝජන සිදුවීම් දෙකක් පිළිබඳව වූ පුවත් වාර්තාවන් දෙකක් පහත දැක්වේ.

1) දිනමිණ (09/21)

"පරිස්සමට තැබූ දැරිය ඇලියාවට ඇරිලා" යන සිරස්තලය දිනමිණ පුවතට යෙදී තිබිණි. එයින්, අදාළ වින්දිත දැරිය 'විනාශ වී' ඇති බවක් විනා, බාලවයස් ලිංගික අපයෝජනයක් සිදුවී ඇති බව හැඟවේ යැයි ඔබ සිතන්නේද?

2) දිවයින (09/20)

"පහළොස් හැවිරිදි දැරියක් සමග මාස තුනක් පවුල් කෑ අමනයා අත්අඩංගුවට" යන සිරස්තලය ඔස්සේ, බාලවයස් ලිංගික අපයෝජනයක් "පවුල් කෑමක්" බවට ලඝු කෙරී ඇතැයි ඔබ සිතන්නේද?

එසේම, එය "පවුල් කෑමක්" ලෙසින් සඳහන් කිරීම ඔස්සේ, දැරියගේ ස්වකැමැත්තෙන් මෙම අපයෝජනය සිදුවූ බවට ඉඟි කෙරේ යැයි පාඨක අපට කිව හැකිද? ලිංගික අපරාධයක් හඳුනාගැනීමේදී බාලවයස් වින්දිතයෙකුගේ කැමැත්ත හෝ අකමැත්ත තිබීම ඊට අදාළ නොවන බව නීතියේ දැක්වේ.

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Dinamina**